**විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ - අදියර 1 - 2015**

---

විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ - අදියර 1 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා බැන්කො බිල්බාඕ විශ්කයා ආජන්ටේරියා එස්.ඒ(බී බී වී ඒ) අතර 2013 ජනවාරි 15 දින එළඹි අංක එස් ආර් එල් -038412 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සබරගමුව පළාතේ ජල සම්පාදන පහසුකම් ඉදි කිරීම හා ව්‍යාප්ත කිරීම මගින් ආරක්ෂිත පානීය ජල සැපයීම හා එමගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම හා දිළිඳු කම අඩු කිරීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,493.66 කට සමාන යූරෝ මිලියන 26.65 ක් විය. ඉන් රු.මිලියන 3,698.06 කට සමාන යූරෝ මිලියන 21.93 ක් සැපයීමට බැන්කො බිල්බාඕ විශ්කයා ආජන්ටේරියා බැංකුව එකඟ වී තිබූ අතර රු.මිලියන 652.60 කට සමාන යූරෝ මිලියන 3.87 ක් සැපයීමට ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (DFCC) එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 143.0 කට සමාන යූරෝ මිලියන 0.85 ක් සැපයීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූලි 24 දින ආරම්භ කරන ලද අතර 2015 ජූලි 24 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2016 පෙබරවාරි 29 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්කාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා

ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත් පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් වන ඇති වන බලපෑම හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

ව්‍යාපෘතිය විසින් 2014 අප්‍රේල් මිලදී ගෙන තිබූ රු.මිලියන 24.42 ක් වටිනා මෝටර් රථ 03 ක් කෙරීගෙන යන වැඩ යටතේ අඛණ්ඩව දක්වා තිබුණි. තවද, 2015 වර්ෂය තුල වැඩ අවසන් කර භාවිතයට ගෙන තිබූ, පිරිවැය රු.මිලියන 264.67 ක් වූ කාර්යාල ගොඩනැගිලි හා කාර්යාල නිල නිවාස කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

**2.2.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 626 අනුව, පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ව්‍යාපෘතිය විසින් වෙනම නඩත්තු කරනු ලබන ගිණුම්කරණ වාර්තා පදනම් කරගෙන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුව ඇත. කෙසේ වුවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ව්‍යාපෘති ගිණුම්කරණ අංශය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා වෙනම මුදල් පොතක් නඩත්තු කිරීමකින් තොරව ව්‍යාපෘති 12 ක් සඳහා එක් මුදල් පොතක් නඩත්තු කර තිබුණි.

**3 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මුල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම් | උපයෝජනය කරන ලද අරමුදල් 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | යූරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | යූරෝ.මිලියන | රු.මිලියන | යූරෝ. මිලියන | රු.මිලියන |
| බීබීවීඒ | 21.93 | 3,698.06 | - | 8.63 | 1,300.44 | 21.93 | 3,557.46 |
| ඩීඑෆ්සීසී | 3.87 | 652.60 | - | - | - | 3.87 | 658.76 |
| ශ්‍රී.ලං.ර | 0.85 | 143.00 | - | 0.48 | 73.38 | 0.95 | 152.76 |
| | 26.65 | 4,493.66 | - | 9.11 | 1,373.82 | 26.75 | 4,368.98 |

## 3.2 භෞතික ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, මාස 02 ක ප්‍රමාදයක් සහිතව 2015 ඔක්තෝබර් 02 දින සිවිල් ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණි. කෙසේ වුවද, ජලය බෙදාහැරීම් කටයුතු ආරම්භ කිරීමෙන් පසුව, තුළුමහ ටැංකිවල පහල ඉවුරු ආරක්ෂණ කිරීමේ ඉතිරි වැඩ, මාර්ග පුනරුත්ථාපනය කිරීම සහ ජල පවිත්‍රාගාරයේ බිම සැකසීම ආදී කටයුතු අවසන් කිරීම සඳහා 2016 පෙබරවාරි 29 දක්වා කාලය දීර්ඝ කිරීමක් සිදුකර තිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් පොම්ප කැලේ ඝන මීටර් 13,000 ක ධාරිතාවයකින් යුත් ජල පොම්පාගාරයක්, ජල පිරිසිදු කිරීමේ පිරියත 02 ක් හා පෙර නිමැවුම් ජල ටැංකි 02 ක වැඩ අවසන් කර තිබුණද, නව සැපයුම් සඳහා ජලනල එළීමේ කටයුතුවල ප්‍රමාදය නිසා 2016 දෙසැම්බර් 31 දින වන විටත් නවජල සම්බන්ධතා 359 කට සැපයුම් ධාරිතාව සීමා කිරීමට සිදු වී තිබුණි. මේ නිසා, ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූ සබරගමුව පළාතේ ජල සම්පාදන පහසුකම් ඉදිකිරීම හා ව්‍යාප්ත කිරීම මගින් ආරක්ෂිත පානීය ජලය සැපයීම අපේක්ෂිත ලෙස ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයට අනුව, පොම්ප කැලේ ඝන මීටර් 2,500 ක ධාරිතාවයකින් යුත් බෙදා හැරීම් කොන්ක්‍රීට් ජල ටැංකියක් ඉදි කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය ඇතිව පසුව පෙර සවි ද්‍රව්‍ය යොදා ගනිමින් ජල ටැංකි 02 ක් ඉදි කර තිබූ අතර පෙර සවි ජල ටැංකි සඳහා වන සත්‍ය පිරිවැය සැලකිල්ලට ගැනීමකින් තොරව, කොන්ක්‍රීට් ටැංකිය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත කර තිබූ පිරිවැය වූ රු.මිලියන 280.09 ක මුදල කොන්ත්‍රාත්කරුට නිදහස් කර තිබුණි. ඉදිරිපත් කරන ලද වගකීම් සහතිකය අනුව පෙරසවි ජල ටැංකිවලද සාමාන්‍ය ඵලදායී ජීවකාලය වසර 20 ක් විය. කෙසේ වුවද ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිකරනු ලබන කොන්ක්‍රීට් ජල ටැංකිවල සාමාන්‍ය ඵලදායී ජීවකාලය වසර 50 ක් වේ.

(ආ) අන්තර් ගෙවීම් සහතිකය අනුව ව්‍යාපෘතිය විසින් රත්නපුර නගර ප්‍රදේශය තුල කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස ඉදිකිරීම සඳහා පිළිවෙලින් වර්ග අඩියකට රු.8,753 ක් සහ රු.16,788 ක් වැයකර තිබුණි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව සමාන වර්ගයේ ගොඩනැගිලි හා නිල නිවාස ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.5,435 ක් හා රු.4,899 ක් පිරිවැයක් වැය වේ. එම නිසා, ගණනය කිරීම්වලට අනුව මෙම කාර්යයන් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 160.86 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

2017 ජනවාරි 31 දින වන විටත්, ජල පවිත්‍රාගාරය පිහිටි ඉඩමේ හිමිකාරීත්වය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා දී නොතිබුණි.